මගේ අංකය :- FE/101/2024
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2024.10. 02

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු හා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හා සෙසු ව්‍යවස්ථාපිත කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීහු හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු,
පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරු, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු,
සියළුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරු/ සාමාන්‍යාධිකාරීවරු,

**<u>ජනාධිපතිවරණය - 2024.09.21</u>**
**<u>මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්</u>**

2024.09.24 දිනැති චක්‍රලේඛ අංක PRE/2024/63 කෙරෙහි අවධානය යොමු කරවමි.

**02.** උක්ත චක්‍රලේඛය පරිදි තම ස්ථිර සේවා ස්ථානයෙන් කරනු ලබන ගෙවීම් කඩිනම් කිරීම සඳහා තම ආයතනයේ ප්‍රමාණවත් තරම් අක්මුදල් නොමැති නම්, ඡන්ද විමසීමේ රාජකාරිවල නිරත කාර්යය මණ්ඩලයේ දීමනා හා ගමන් වියදම්වලට අදාළ ගෙවීම් වවුචර් කඩිනමින් ගෙන්වා ගෙන ඒවා චක්‍රලේඛ උපදෙස්වලට අනුව පරීක්ෂා කර නිවැරදිතාවය තහවුරු කර ගැනීමෙන් පසු උක්ත චක්‍රලේඛයේ 10.1 හා 10.2 අනුඡේදවල සඳහන් උපලේඛන සම්පූර්ණ කර ඉහත ලිපිනයට එවීමෙන් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය අක්මුදල් හෝ ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලමි.

**03.** ජනාධිපතිවරණයට අදාළ සියලුම ගෙවීම් 2024.11.30ට පෙර ගෙවා අවසන් කිරීමට සැලසුම් කර ඇති බැවින් ඉහත උපදෙස් පිළිපදින මෙන් ඉල්ලමි.

**කේ.එස්.පී. පෙරේරා**
**ප්‍රධාන මූල්‍ය නිලධාරි**
මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට